# 30 පාඩම
# දහම රකින්නා දහමින් රැකේ

"දාළිද්දියම්පි භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං
ගිහීනො කාමභොගිනො"

- අංගුත්තර නිකාය ඉණ සූත්‍රය -

මෙම බුදු වදනට අනුව කාමභෝගී ගිහි ජනයාට දිළිඳුකම යනු දුකකි. දිළිඳුකමේ දුකට හසු වූ ගිහියාගේ මෙලොව ජීවිතය අසාර්ථක ය. ඊට හේතුව ගිහිකම හුදෙක් කාමභෝගීත්වය මත ම පදනම් වීම යි. දුප්පත්කමින් වෙළුණු මෙලොවක් ඇති ගිහියාගේ පරලොව ද අසාර්ථක ය. දුප්පත්කමේ අගහිගකමින් හා පීඩනයෙන් දිවිගෙවන්නාට විමුක්තියක් පිළිබඳව සිතන්නට පවා ඉඩක් නැත. මේ තොරතුරුවලින් පැහැදිලි වන්නේ පුද්ගල ජීවිතයක සියලු අභිමතාර්ථයන් දිළිඳුකම නිසා නැති වන බව යි.

මෙසේ ආර්ථික අපහසුකම මත ඇතිවන දිළිඳුකම පුද්ගල ජීවිතයට සෘජුව ම බලපා විනාශ මුඛයට ඇද දමද්දී එය ඔහුගේ සමාජ ජීවිතයට ද හානි පමුණුවයි. ඒ දිළිඳුකම සමාජ දූෂිත ප්‍රධාන සාධකය වන නිස යි. දිළිඳුකම ඇති සමාජයක වෙසෙන පුද්ගලයා දිළිඳුකම නිසා ම විවිධාකාර සමාජාපචාර රාශියක හිමිකරුවෙක් වෙයි. ඉන් සිදුවන්නේ පුද්ගලයා පමණක් නොව සමස්ත සමාජය ම අගාධයට යාමයි. මෙය හේතුඵලවාදී ව සිදුවන ආකාරය පිළිබදව අපූරු විස්තරයක් දීඝ නිකාය චක්කවත්ති සීහනාද සූත්‍රයේ සඳහන් වේ. එහි දැක්වෙන්නේ රටක පාලකයා මැදිහත් වී දිළිඳුකමින් මිදීමට කටයුතු සම්පාදනය නොකළහොත් රටට අත්වන භයානක ඉරණමයි. ඒ අනුව දිළිඳුකම වැඩි වී ගොස් පිළිවෙළින් සොරකම, ආයුධ ගැනීම, ප්‍රාණඝාතය, බොරුකීම ආදිය අවසානයේ මහා විනාශයකින් පසු ව ඔවුනොවුන් පිළිබඳ මෘග සංඥාව (සිවුපා ආදී සතුන් තුළ ඇතිවන සිතිවිලි ඇති වී, අවිවලින් ඇන කොටා ගෙන වැනසෙන බවත් දැක්වේ.

මේ අයුරින් පුද්ගල පරිහානියටත් සමාජ පරිහානියටත් මූල හේතුව දිළිඳුකම බව පැහැදිලි ය. බුදුරජාණන් වහන්සේගේ ආර්ථික ප්‍රතිපත්තියට අදාළ ඉගැන්වීම් ඉදිරිපත් වී ඇත්තේ එම දිළිඳුකමින් මිදී ආර්ථික ශක්තිය ඇතිකර ගැනීම සඳහා ය. ඒ තුළින් මෙලොව ජීවිතය අර්ථදායි ව ගෙවන්නටත් (දිට්ඨධම්ම සුඛ) අර්ථදායි පරලොව ජීවිතය පිළිබඳ බලාපොරොත්තු තබන්නටත් (සම්පරායික සුඛ) පරම විමුක්තිය පිළිබඳ අපේක්ෂාවෙන් කටයුතු කරන්නටත් (පරමත්‍ථ සුඛ) හැකිවන බව දේශිත ය.

ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධ ව බෞද්ධ ඉගැන්වීම ප්‍රධාන තේමා තුනක් යටතේ දැක්වේ.

01. ධනෝපාර්ජනය හෙවත් ධනය ඉපයීම.

02. ධන සුරක්ෂණය හෙවත් ආරක්ෂා කිරීම.

03. ධන විසර්ජනය හෙවත් පරිහරණය. යනු ඒවා ය.

**1. ධනෝපාර්ජනය හෙවත් ධනය ඉපයීම**

අංගුත්තර නිකාය අණන සූත්‍රයේ දැක්වෙන ආකාරයට ධනය ඉපයිය යුත්තේ දැහැමින් උපයන ලද ධනයක් ඇති ව එය තමන්ට ඇතැයි සතුටු විය හැකි නම් පමණි.

"අත්ථි මෙ භොග සුඛං අධිගච්ඡති සොමනස්සං"

මින් තහවුරු වන්නේ කුමන හෝ ආකාරයකින් ධනය උපයා සතුටු විය නොහැකි බවයි. අංගුත්තර නිකාය ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී දක්වා ඇත්තේ උපයන ලද ධනය ධාර්මික විය යුතු ලෙසට යි. ඊට අදාළ ක්‍රමවේදය ද එහි සඳහන් ව ඇත. ඒ අනුව

| | |
|---|---|
| 01. උට්ඨාන විරියාධිගතෙහි | - උට්ඨාන වීර්යයෙන් |
| 02. බාහාබල පරිචිතේහි | - දෑත දෙපයේ මහන්සියෙන් |
| 03. සේදා වක්ඛිත්තෙහි | - දහඩිය වගුරුවා |
| 04. ධම්මිකෙහි ධම්ම ලද්ධෙහි | - ධාර්මික ව |

ධනය ඉපයිය යුතු ය. මෙම මූලික පදනමේ පිහිටා,

* වෙළඳාම
* කෘෂිකර්මාන්තය
* රාජ්‍ය සේවය හා
* වෙනත් ශිල්ප කර්මාන්ත

ඇසුරෙන් තම රැකියාව සකසා ගත හැකි ය. එහි දී ද

| | |
|---|---|
| 01. මංස වාණිජ්ජා | - මස් වෙළඳාම |
| 02. සත්ත වාණිජ්ජා | - සත්ත්ව වෙළඳාම |
| 03. සත්ථ වාණිජ්ජා | - ආයුධ වෙළඳාම |
| 04. මජ්ජ වාණිජ්ජා | - මත්පැන් වෙළඳාම |
| 05. විස වාණිජ්ජා | - වසවිෂ වෙළඳාම |

යන වැරදි වෙළඳාම් පහෙන් හා

01. තුලා කූට - හොර තරාදි

**02. මාන කූට** - **හොර මිනුම් ක්‍රම**
**03. කංස කූට** - **ව්‍යාජ භාණ්ඩ**

වශයෙන් කෙරෙන වැරදිවලින් ද මිදී වෙළඳාම කළ යුතු අතර පොදුවේ, සිය රැකියාව කිරීමේ දී

01. **උක්කෝටන** - **අල්ලස් ගැනීම**
**02. වංචන** - **රැවටීම**
**03. විපරාමොස** - **හිංසන**
**04. ගුම්බවිපරාමොස** - **මං පැහැරීම**

වැනි විසමාචාරවලට හසු නොවී කටයුතු කිරීමට ද වගබලා ගත යුතු ය.

මේ ආකාරව කුමන හෝ ධාර්මික මාධ්‍යයකින් උපයන ලද ධනය ක්‍රමානුකූල ව "සෙමෙන්" උපයන ලද්දක් විය යුතු ය. එය බමරු පැණි රැස්කරන්නා සේ ය (භමරස්සේව ඉරීයතො) වේයන් තුඹස් බඳින්නා සේ ය (වම්මිකො වූපචීයති) එමෙන් ම එය සිය අවශ්‍යතා පිරිමසා ලිය හැකි "ප්‍රමාණවත්" ධනයක් ද විය යුතු ය. එසේ නො වී ධනයම ජීවිතය යැයි සිතා එහි ගැතිව, මුළාව, නිමග්ගව (එරී) ධනය උපයන්නට ඉඩක් බුදුසමයෙන් නොලැබේ.

**2. ධන සුරක්ෂණය හෙවත් ආරක්ෂා කිරීම.**

ඉහත ක්‍රමවේදය ඔස්සේ ධනය උපයා ඊළඟට සිදුකළ යුතුව ඇත්තේ වියදම් කිරීම යි. එහෙත් වියදම් කිරීමට අවශ්‍ය නම් එය පළමු ව සුරක්ෂණය විය යුතු ය. ඊට හේතුව වියදමට පෙර ධනය විනාශවන ක්‍රම කීපයක් ඇති බැවිනි. දීඝ නිකාය සිගාලෝවාද සූත්‍රයේ "භොග විනාස මුඛ" (අපාය මුඛ) යනුවෙන් ධනය විනාශ වන ක්‍රම හයක් පෙන්වා දී ඇත. එනම්

**01. මත්පැන් (සුරා) පානයෙ හි යෙදීම**
**02. නොකල්හි වීථි සංචාරය කිරීම**
**03. උත්සව දර්ශනාදියෙහි ලොල් වීම**
**04. දූ කෙළියෙහි යෙදීම (සූදුව)**
**05. පාපී මිතුරන් ආශ්‍රය කිරීම**
**06. අලසකම**

එමෙන් ම

**01. සොරුන්ගෙන්**

02. සතුරන්ගෙන්
03. ගින්නෙන්
04. ජලයෙන්
05. රජුගෙන් ද වේයන්, මීයන් වැනි සතුන් හා වෙනත් උවදුරුවලින් ද උපයන ධනය විනාශ වී යා හැකි යි. ඉහතින් දක්වූ සියලු ක්‍රමවලින් ධනය රැක ගැනීමට වගබලා ගත යුතු ය. ඒ බුද්ධිමත් ව සිතා බලා සැලකිලිමත්ව කටයුතු කිරීමෙනි.

## 3. ධන විසර්ජනය හෙවත් වියදම් කිරීම

අංගුත්තර නිකාය ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දි උත්සාහයෙන් යුක්ත ව ධනය ඉපයීම "උට්ඨාන සම්පදා" යනුවෙනුත් මනා සැලකිල්ලෙන් ධනය ආරක්ෂා කර ගැනීම "ආරක්ඛ සම්පදා" යනුවෙනුත් දක්වා ඇත. එහිම "සමජීවිකතා" යනුවෙන් සංකල්පයක් දක්වා ඇත. ඒ බුද්ධිමත් ධන පරිහරණයයි.

උත්සාහයෙන් ධනය උපයා සුරක්ෂිත වූ ධනයක් සහිත ව සිටින පුද්ගලයා අන්තගාමී පරිභෝජනයකට නොයා යුතු ය. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී එවැනි අන්ත දෙකක් පෙන්වා දී ඇත.

01. අතු සොලවා කඩා දමා දිවුල් (දිඹුල්) පල කන්නෙකු සේ උපයන ලද ධනය සම්පූර්ණයෙන් වියදම් කිරීමේ අන්තය - උදුම්බර ඛාදික.

02. නොකා නොබී අකාලයේ මියැදෙන්නට උත්සාහ ගන්නෙකු සේ උපයන ලද ධනය සම්පූර්ණයෙන් ඉතිරි කර ගැනීමේ අන්තය - අජද්ධු මාරික.

මේ අන්තගාමී ධන පරිහරණය ප්‍රතික්ෂේප කරන බුදුසමය ඒ සඳහා මධ්‍යස්ථ ක්‍රමයක් හඳුන්වා දී ඇත. ඒ බෙදා පරිහරණය කිරීම යි. සිගාලෝවාද සූත්‍රයෙන් තහවුරු කරන එම ක්‍රමය යටතේ උපයන ලද ධනය කොටස් හතරකට බෙදා ඉන් එක කොටසක් දෛනික පරිභෝජනයටත්, කොටස් දෙකක් තිබෙන ධනය වැඩිකර ගැනීම සඳහා ආයෝජනයටත්, සතරවෙනි කොටස ආපදා අවස්ථාවක දී ගැනීම සඳහා තැන්පත් (නිධන්) කර තැබීමත් කළ යුතු ය.

''එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයොජයෙ
චතුත්ථංච නිධාපෙය්‍ය
ආපදාසු භවිස්සති''

මෙම මූලික ධන පරිහරණ සංකල්පයට අමතර ව බුදුසමය නිර්දේශ කරන තවත් සංකල්පයක් ඇත. ඒ,

"දත්වා ච භුත්වා ච යථානුභාවං"

යන දේශනාවට අනුව සුදුසු පරිදි ආත්මාර්ථයටත් පරාර්ථයටත් ගැළපෙන සේ වෙන් කොට පරිහරණය කිරීම යි. ඒ අනුව පළමුව තමන් අවශ්‍ය පරිදි ක්‍රමවත් ව පරිභෝජනය කොට සතුටු විය යුතු ය. (භොග සුඛය)

''අත්තානං සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති''

අනතුරුව දෙමව්පියන්ට ද ඤාති මිත්‍රාදීන්ට ද දාසි දස් කම්කරුවන්ට ද සුදුසු පරිදි ධනයෙන් කොටස් වෙන් කොට දී ඔවුන් සුවපත් කොට තමන් සතුට ලැබිය යුතු ය. මේ බව අංගුත්තර නිකාය පත්තකම්ම සූත්‍රයේ තොරතුරු සඳහන් වේ.

මීට අමතර ව අංගුත්තර නිකාය පත්තකම්ම සූත්‍රයේ දී උපයන ධනය පොදු පරිහරණයට වෙන් කළ යුතු තවත් ආකාරයක් දක්වා ඇත. ඒ පංච බලි සංකල්පය යි. මින් අදහස් කරන්නේ ඒ ඒ අවස්ථා සඳහා තම ධනය වෙන් කළ යුතු බව යි. ඒ අවස්ථා නම්,

01. ඤාති බලි - ඤාති මිත්‍රාදීන් වෙනුවෙන්
02. අතිථි බලි - ආගන්තුකයින් වෙනුවෙන්
03. පුබ්බපෙත බලි - මිය ගිය ඤාතීන් වෙනුවෙන්
04. දේවතා බලි - ආගමික කටයුතු සඳහා
05. රාජ බලි - රාජ්‍යය වෙනුවෙන්

මේ ආකාරයට උත්සාහයෙන් ධනය උපයා එය විනාශ වීමට නොදී ආරක්ෂා කර ගනිමින් ආත්මාර්ථය හා පරාර්ථය ඉටුවන සේ පොදු වස්තුවක් කොට සලකා ධනය පරිහරණය කළ යුතු බව බුදු සමයෙන් නිර්දේශ වී ඇත.

මෙම ක්‍රමයට ආර්ථික ශක්තිය ඇතිකරගත් පුද්ගලයා මෙලොව වශයෙන් සාර්ථක වී පැසසුමට ලක්වන අතර පරලොව සුවපත් භාවය ද ළඟා කර ගනී.

ඉධෙව නං පසංසන්ති
පෙච්ච සග්ගෙ පමොදති

**අභ්‍යාස**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න පහදන්න.

01. දිළිඳුකම සමාජ දූෂණයට ඉවහල් වන්නේ කෙසේදැයි පහදන්න.
02. පුද්ගල හා සමාජ ආර්ථික ශක්තිය බුදුසමයෙන් අගයන්නේ කවර හේතු නිසාදැයි දක්වන්න.
03. අධාර්මික ධනෝපාර්ජනය විවිධ අර්බුධ හා ගැටලුවලට පාදක වන අයුරු නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
04. සාමාන්‍ය ආර්ථික විද්‍යාවේ දී අය සහ වැය පිළිබඳ පමණක් දක්වන අතර බෞද්ධ ආර්ථික ප්‍රතිපත්තියේ දී ධන සුරක්‍ෂණයක් පිළිබඳ දක්වා ඇත. විමසන්න.
05. බුදුසමයෙන් පැහැදිලි කරන ආකාරයට පුද්ගලයා සතු විය යුත්තේ ධනය ඉපයීම, ආරක්‍ෂණය, හා පරිහරණය සම්බන්ධ ශික්ෂණයකි. විමසන්න.